**මැදවච්චිය ප්‍රාදේශීය සභාව - 2023**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මුදල් ගෙවා නොමැති නමුත්, රු.197,000 කින් සවිකිරීම වත්කම් වැඩි වී තිබීම ණයගැතියෝ හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිනොගන්නා බව. | මෙම වත්කම් සඳහා මුදල් ගෙවා නොමැති නමුත් වත්කම් වැඩි වී ඇති බැවින් ණයගැතියන් සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මාර්ග, පාලම් හා බෝක්කු ක්ෂය රු.973,709 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ රු.1,071,762 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | පිළි ගන්නා බව | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ විදුලි උපකරණ සවිකිරීම් ක්ෂය රු.433,184 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සහ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.390,399 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | පිළි ගන්නා බව | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුය |
| (ඈ) | රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ස්ථාවර තැන්පත් ගිණුමක් වෙනුවෙන් ලැබිය යුතු පොලිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,148,352 ක් වුවත් එය රු.1,191,986 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | බැංකුව විසින් 2023 දෙසැම්බර් 31 දිනට පොලිය රු.169,631 ක් ලෙස ගණනය කර තිබුණු බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වත්කම් හා වගකීම් ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩ කාමර කුලී ආදායම රු.3,207,688 ක් වුවත් කඩ කාමර කුලී ලේඛනය අනුව එය රු.2,972,328 ක් වුයෙන් රු.235,360 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන් නිවැරදි බව හා ලේඛන නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | මාර්ග පරිහරණ ගාස්තු ආදායම | 1,270,000 | (i) යාවත්කාලීන කළ ආදායම් ලේඛන<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(iii) අයදුම්පත් ගොණු | ඉදිරියේදී මෙම ශේෂයන් තහවුරු කර ගැනීමට කටයුතු කරන බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | දැන්වීම් පුවරු ආදායම | 199,450 | -එම- | -එම- | -එම- |
| (ඇ) | ගවයන් ඝාතනය කිරීමේ ආදායම | 40,230 | -එම- | -එම- | -එම- |
| (ඈ) | වාහන කුලියට ලබාදීමේ ආදායම | 307,900 | -එම- | -එම- | -එම- |
| (ඉ) | නැණසල ආදායම | 821,650 | -එම- | -එම- | -එම- |
| (ඊ) | තොගය සඳහා උපකරණ තැනීම් | 749,306 | (i) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(ii) විස්තරාත්මක උපලේඛන<br>(iii) සමීක්ෂණ මණ්ඩල වාර්තා | ඉදිරියේදී මෙම ශේෂයන් තහවුරු කර ගැනීමට කටයුතු කරන බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (උ) | ලැබිය යුතු වෙනත් 01 | 20,605 | -එම- | -එම- | -එම- |
| (ඌ) | ලැබිය යුතු විවිධ ආදායම් | 2,211,238 | -එම- | -එම- | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (එ) | ලැබිය යුතු කඩා ඉවත්කල කඩකාමර වෙනුවෙන් වූ කුලිය | 678,474 | (i) විස්තරාත්මක උපලේඛන<br>(ii) වයස් විශ්ලේෂණ | -එම- | -එම- |
| (ඒ) | ලැබිය යුතු නලළිං ගාස්තු | 575,000 | -එම- | -එම- | -එම- |
| (ඔ) | ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම් | 638,550 | -එම- | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය (ඇ) ඡේදය | ආදායම් රැස්කිරීම, වාහන බැහැරවීම්, වාහන අලුත්වැඩියාව සහ වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් සඵලදායි අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක වී නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | ජාතික විගණන පනතට අනුකූල විය යුතුය. |
| (ආ) | 1988 අගෝස්තු 23 දිනැති අතුරු ව්‍යවස්ථාවේ 20 අතුරු ව්‍යවස්ථාව | මස් මාළු වෙළඳාම විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණු බව | අදහස් දක්වා නොමැති බව. | වැළඳගත් සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.2,653,158 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.11,835,280 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,498,664 | 4,738,766 | 3,371,917 | 6,300,713 | 4,024,692 | 4,501,647 | 3,590,980 | 4,933,864 |
| (ii) | කුලී | 33,136,907 | 16,578,785 | 8,298,358 | 35,796,001 | 23,069,415 | 18,328,055 | 11,378,639 | 27,515,574 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 519,027 | 427,200 | 427,200 | 90,500 | 361,730 | 502,683 | 502,683 | 90,500 |
| (iv) | වෙනත් ආදායම් | 12,275,818 | 12,575,582 | 12,087,886 | 15,918,472 | 13,246,712 | 20,503,417 | 21,768,719 | 15,430,776 |
| | | 50,430,416 | 34,320,333 | 24,185,361 | 58,105,686 | 40,702,549 | 43,835,802 | 37,241,021 | 47,970,714 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට මුළු හිඟ වරිපනම් වලින් සියයට 81 ක් වූ රු.5,563,864 ක් අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | වසර ගණනාවක සිට පැවත එන රු.231,750 ක කර්මාන්ත බදු හිඟය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සභාවට අයත් කඩ කාමර 100 කට අදාළව ලැබිය යුතු කඩ කුලී වලින් සියයට 88 ක් වූ රු.29,971,165 ක කුලී අයවී නොතිබුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාව සතු වත්කම් බදුදීම වෙනුවෙන් 2023 වර්ෂයට පෙර කාලය වෙනුවෙන් අයවිය යුතු රු.451,908 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සභාව සතු යන්ත්‍ර කුලියට ලබාදීම වෙනුවෙන් 2021 වර්ෂය සඳහා අයවිය යුතු රු.136,250 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර නොතිබුණි. | අයකර ගැනීම සඳහා ලිඛිතව දැනුම්දී ඇති බව. | අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු ආදායම රු.439,100 ක් ද බලපත්‍ර ගාස්තු ආදායම රු.761,750 ක් ද අයකරගෙන නොතිබුණු අතර එම පාර්ශවයන් පිළිබඳ විස්තර ද සභාව සතුව නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,100,361 ක් හා මුද්දර ගාස්තු රු.2,000,000 ක් වූ අතර 2023 දෙසැම්බර් මාසයේ උසාවි දඩ මුදල් හා 2022 හා 2023 වර්ෂවල මුද්දර ගාස්තු තහවුරු කරගෙන ද නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| මැදවච්චිය පුස්තකාලයේ තිබි 2023 දෙසැම්බර් 31 දින වන විට අස්ථානගත වී තිබුණු වටිනාකම රු.99,171 ක් වූ පොත් 615 ක් සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව හඳුනාගෙන එම අලාභය අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | වෙළෙඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු සහ දැන්වීම් පුවරු ආදායම් අයකර ගැනීම සඳහා 2022 වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ සමීක්ෂණ සිදුකර නොතිබීම නිසා අදාළ ආයතන වෙතින් අයවිය යුතු ගාස්තු නිවැරදිව හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි. | අදාළ සමීක්ෂණ සිදුකර ආදායම් ගණනය කර තිබුණු බව | වාර්ෂිකව සමීක්ෂණ සිදුකර ආදායම් හඳුනා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදී ජල සම්පාදන මණ්ඩලයට රු.2,343,240 ක් ගෙවා ඉදිකරන ලද පිළිසරු ඒකකයේ පිහිටි ප්‍රති ආශ්‍රිත (RO) ජල පිරිපහදු යන්ත්‍රය අක්‍රීයවීම නිසා ඒ තුළින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | මෙම අක්‍රීය ජල පිරිපහදු යන්ත්‍රය වෙනත් ස්ථානයක සවිකිරීමට නියමිත බව. | ජල පිරිපහදු යන්ත්‍රය ක්‍රියාකරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | වාර්ෂිකව බදුදිය හැකි සභාවට අයත් දේපළ වෙනුවෙන් ස්ථාන සකස් කර නොතිබීම නිසා සභාවට ආදායම් ලබාගත හැකි අවස්ථා අහිමි වී තිබුණි. | ඉදිරියේදී ස්ථාන සකස් කර බදුදීමට කටයුතු කරන බව. | ස්ථාන සකස් කර බදුදීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.28,344,077 ක් වූ පෙර වර්ෂවලට අදාළ වරිපනම් බදු සහ කුලී හිඟ ආදායම්වලින් සියයට 41 ක් වූ රු.13,161,228 ක් රැස්කර නොතිබුණු නමුත් හිඟ ආදායම් රැස්කිරීම වෙනුවෙන් නිලධාරීන් 04 දෙනෙකු වෙත රු.49,642 ක දීමනා ගෙවා තිබුණි. | කර්මාන්ත බදු සහ ව්‍යාපාර බදුවලින් සියයට 80 ක් ඉක්මවා එකතු කිරීම පදනම් කරගෙන මෙම දිරිදීමනා ගෙවා ඇති බව. | හිඟ වරිපනම් හා කුලී අයකර ගැනීමෙන් පසු පමණක් දිරිදීමනා ගෙවිය යුතුය. |

## 3.4 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| විධිමත් ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය කිරීමකින් හා සභා අනුමැතියකින් තොරව මැදවච්චිය නව පොදු වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 02 ක් ඉදිකර ගැනීමේ පදනම මත පුද්ගලයින් දෙදෙනෙකු වෙත වසර 13 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර ලබාදී තිබුණ ද විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ද ලබා ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කඩ කාමර වසර 03 ක් ඉක්ම වූ කාලයක් සඳහා බදු දීම වෙනුවෙන් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් අංක 251-6989 දරන කැබ්රථය 2021 වර්ෂයේදී ද අංක LF-4797 දරන මහේන්ද්‍රා බොලෙරෝ රථය 2022 ජනවාරි මාසයේදී ද ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව පෞද්ගලික ගරාජයකට රැගෙන ගොස් තිබුණු අතර අලුත්වැඩියා කිරීමකින් තොරව ධාවනය කළ නොහැකි තත්ත්වයෙන් ගලවන ලද උපාංග ද සමඟ 2023 වර්ෂයේදී නැවත සභාවට රැගෙනවිත් තිබුණි. මෙම වාහන අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | මෙම වාහන පිළිබඳ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගෙන් වාර්තාවක් ලබාගෙන අලුත්වැඩියා කිරීමට කටයුතු කළයුතු අතර වගකිවයුතු පාර්ශව වලින් සභාවට සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | භාවිත තත්ත්වයේ පවතින යතුරුපැදියක් හා ජල බවුසරයක් අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අදාළ වාහනවල පවතින තත්ත්වයට අනුව වෙන්දේසි කිරීම් සහ අලුත්වැඩියා කිරීම් සිදුකළ යුතුය. |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාවට අයත් වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී එක් පෞද්ගලික ආයතනයක් පමණක් තෝරාගෙන එම ආයතනය වෙත රු.6,522,290 ක් ගෙවා තිබුණි. එම ප්‍රසම්පාදන කමිටුවට සභිකයින් තිදෙනෙක් හා නිලධාරීන් දෙදෙනෙක් ඇතුළත් වන නමුත් එක් නිලධාරියෙක් පමණක් එම කමිටු රැස්වීම් සඳහා සහභාගි වී තිබුණි. | පිළිගන්නා බව. | කමිටු සාමාජිකයින් සියලු දෙනාම සහභාගී කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 179 කින් කර්තව්‍යයන් 76 ක් ඉටු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම කර්තව්‍යයන් 76 ඉටුකිරීමට කටයුතු කරන බව. | සැලසුම් කරන ලද කාර්යයන් වර්ෂය තුළදී නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත තිබූ නමුත් එය සක්‍රියව ක්‍රියාත්මක නොවීම නිසා එකතුවන කසළ ඉසින්බැස්සගල රක්ෂිතයේ වලවල් කපා බැහැර කිරීම සිදුකරමින් පැවතුණි. | ගිනි තැබීමක් සිදු නොකරන ලද අතර වලවල් තුළට බැහැර කිරීම සිදු කරනු ලබන බව | නොදිරන කසළ විධිමත්ව බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |